•මුලින්ම කියන්න ඕනෙ මේ pdf එකේදි මම මාතෘකා තුනක් ගැන කතා කරනවා.ලොකු theories ගොඩක් නැති නිසයි මාතෘකා හතක් මේ pdf එකේදි කතා කරන්නෙ. ඒ උනාට මතක තියාගන්න,theories අඩු උනාට මේවා ගොඩක් වැදගත් මාතෘකා.ඒක නිසා හරියට අවදානෙන් මේ දේවල් ඉගෙනගන්න.

•අපි බලමු දැන් මාතෘකා ටික මොනවද කියලා.

1)Imbalance
2)Displacement
3)Fair Value Gap(FVG)
4)Volume Imbalance
5)Liquidity Void
6)Balance Price Range(BPR)
7)Inversion FVG(IFVG)

•දැන් අපි මේ මාතෘකා එකින් එක ගැන වෙන වෙනම කතා කරමු.

## 1) IMBALANCE

•Imbalance එකක් හැදෙන්න නම් market එක, නැවතීමක් නැතුව දිගටම buy හෝ sell වීමක් වෙන්න ඕනේ. ඒ කිව්වෙ retest නොකර market එක දිගටම buy වීමක් හෝ sell වීමක් වෙන්න ඕනේ.

•එහෙම imbalance එකක් හැදුනට පස්සෙ market එක ඒක fill කරන්න යන්න ඕනෙ.ඒක normally අපි කියන්නෙ අඩුම තරමෙ 25%ක් වත් cover කරන්න ඕනෙ කියලා.ඒ කිව්වෙ ඒ උන movement එකෙන් 25% ක් වත් recover කරන්න ඕනෙ කියලා.
•දැන් අපි බලමු image එකකින්ම මොකද්ද මේ මන් කිව්වෙ කියලා.එතකොට ඔයාලට තවත් හොඳට පැහැදිලි වෙයි.




Buy Side
AI-generated content




Sell Side
AI-generated content

## 2)DISPLACEMENT

•මේක Imbalance එකකට ටිකක් සමානයි. ටිකක් කිව්වට ටිකක් නෙවෙයි.බොහෝ දුරට මේක සමානයි imbalance එකකටම.මෙතනදි වේගෙන් market එක move වෙලා හැදෙන candles වලට තමයි අපි displacement එකක් කියල කියන්නේ.

•මෙතනදි වැදගත් කාරනාව තමයි displacement එකක් හැදෙනකොට අනිවාර්යයෙන් BOS එකක් හරි CHOCH එකක් හරි හැදෙන්නම ඕනෙ.

•එහෙම නැතුව කිසිම වෙලාවක displacement එකක් හැදෙන්නෙ නෑ.ඔයාලට පුලුවන් එහෙම ඒවට වෙනත් නම් භාවිතා කරන්න. දැනට මන් කියල දුන්නෙ imbalance කියන එක විතරයි.ඉස්සරහට තව උගන්නනවා.දැන් අපි බලමු displacement එකක්.




•ඔයාලට මෙතන සම්පූර්ණ chart එකම පේනවා ඇති. ඒ වගේම මම mark කරල තියෙන candles දෙකත් පේනව ඇති.ඒ මම mark කරල තියෙන්නෙ displacement එකක්.ඒ වගේම ඔයාලට පේනව ඇති BOS එකකුත් හදාගෙනමයි ගිහින් තියෙන්නෙ කියලා.

## 3)FAIR VALUE GAP(FVG)

•FVG එකක් හැදෙන්න නම් candles තුනක් ඕනෙ වෙනවා.මෙතනදි candles තුනේ මැද

candle එකේ fill නොවුන කොටසක් තියෙනවනම් අපි ඒකට කියනවා FVG එකක් කියලා.මෙතනදි candle එකේ body එක විතරක් නෙවෙයි.wick එකත් අපි සලකනවා.ඒ කිව්වෙ candle තුනේදි මැද candle එක,උඩ සහ යට candles වල wicks වලින්වත් මැද candle එක cover වෙලා තියෙන්න බෑ.එහෙම cover වෙලානම් ඒක FVG එකක් වෙන්නෙ නෑ.



•දැන් අපි FVG කියන මාතෘකාව ඇතුලෙ තියෙන sub titles දෙකක් ගැන කතා කරමු.BISI සහ SIBI.

## 3.1)Buy Side Imbalance Sell Side Inefficiency(BISI)

•එක ලඟ තියෙන Candles තුනක් තමයි අපි FVG එකක් බලන්න use කරනව කියල කිව්වෙ.මෙතනදිත් එහෙම තමයි.buy side ගැන බැලුවහම මෙන්න මෙහෙමයි වෙන්නේ.Candles තුනේ පලවෙනි candle එකේ High එකයි තුන් වෙනි candle එකේ low එකයි අතර දෙවනි candle එකේ හිස් තැනක් තියෙනවනම් අපි ඒක BISI එකක් කියල හඳුන්වනවා.

•මෙතනදි හරියටම සූක්ශමව මේක අඳුරගන්න බලන්න.මොකද ඔයාල මේ දේවල් වැරදියට අඳුරගත්තොත් ඔයාලගෙ analys එකයි වරදින්නේ.



## 3.1)Sell Side Imbalance Buy Side Inefficiency(SIBI)

•එක ලඟ තියෙන Candles තුනක් තමයි අපි FVG එකක් බලන්න use කරනව කියල කිව්වෙ.මෙතනදිත් එහෙම තමයි.sell side ගැන බැලුවහම මෙන්න මෙහෙමයි වෙන්නේ.Candles තුනේ පලවෙනි candle එකේ low එකයි තුන් වෙනි candle එකේ high එකයි අතර දෙවනි candle එකේ හිස් තැනක්

තියෙනවනම් අපි ඒක SIBI එකක් කියල හඳුන්වනවා.

•මෙතනදි හරියටම සූක්ශමව මේක අඳුරගන්න බලන්න.මොකද ඔයාල මේ දේවල් වැරදියට අඳුරගත්තොත් ඔයාලගෙ analys එකයි වරදින්නේ.



•මම හිතනවා මේ උදාහරණෙත් එක්ක ඔයාලට පැහැදිලි වෙන්න ඇති කියල හොඳටම මේ මොකද්ද කියන එක ගැන.

## 4) VOLUME IMBALANCE

•මෙතනදි අපි use කරන්නෙ candles දෙකයි.එක ලඟ තියෙන candles දෙකක් හැදුනට පස්සෙ මේ candles දෙක අතර පොඩි හිස් තැනක් තිබිලා ඒ හිස් තැන candles වල wicks වලින් fill කරොත් අපි කියනව එතනට Volume Imbalance එකක් කියලා.



## 5) LIQUIDITY VOID

•Liquidity void එකක් කියන්නෙ එක ළඟ candles දෙකක් හැදුනට පස්සෙ පලවෙනි candle එකේ closing price එක සහ දෙවනි candle එකේ opening price එක අතර පොඩි හිඩසක් තියෙන එකට.



## 6) BALANCE PRICE RANGE(BPR)

•අපි කලින් ඉගෙනගත්තනෙ FVG එක ගැන. මෙතනදිත් FVG එක සම්බන්ද දෙයක් ගැනම තමයි කතා කරන්නේ.
•BPR එකක් කියල කියන්නේ FVG එකක් හැදිල ඒක ඉස්සරහින් අයෙත් FVG එකක් හැදුනොත් ඒකට.එතකොට FVG දෙකටම පොදු කොටසක් තියෙනවනෙ.අන්න ඒකතමයි අපි BPR කියල ගන්නේ.



## 7)INVERSION FVG(IFVG)

•FVG එකක් හැදුනට පස්සේ Market එක අයෙත් ඒ හැදුන FVG එකට ඇවිල්ල නැවත හැරීමක් නැතුව ඒ දිශාවටම market එක run උනොත් අපි ඒ FVG එක IFVG එකක් කියල හඳුන්වනවා.

•මතක තියාගන්න මේ IFVG එකකින් පුලුවන් market එක run වෙන side එක වෙනස් කරන්නත්.ඒක හින්ද හොඳ අවදානෙන් ඉඳල මේ zones හරියට අඳුරගන්න. නැත්තන් ඔයාලගෙ analys එක වරදින්න පුලුවන්.

•buy side සහ sell side කියන දෙකටම මේ IFVG හැදෙනවා.මම පහලින් image එකක් දාන්නම් sell side FVG එකක් cover කරගෙන buy movement එක continue කරපු.ඔයාලට idea එකක් එයි එතකොට මේ ගැන.



•ඉතින් ඔන්න අපි මේ pdf එකෙන් මාතෘකා 7ක් ගැන කතා කරා.ඔයාලට තවත් පැහැදිලිව බලාගන්න ඕනෙනම් මේකට අදාල video එක බලන්න.එතකොට තවත් හොඳට තේරෙයි.

All rights reserved©.
ORGA AUKLAND (PVT) LTD